## බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයන්ගේ මධ්‍යසාර ප්‍රතිපත්තියට ලාංකීය ජන සමාජයෙන් එල්ල වූ ප්‍රතිවිරෝධය

ඩබ්ලිව්.එම් හිරාන් මධුසංඛ[1]

කුමන හෝ කරුණක් මූලික කරගෙන එක් පිරිසක් විසින් හෝ ජන කණ්ඩායමක් විසින් තවත් භූගෝලීය ප්‍රදේශයක හෝ ජන කණ්ඩායමක් තම ග්‍රහණයට ගත් විට පාලක පිරිස විසින් තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පාලිත ජන කණ්ඩායම භාවිත කිරීම ස්වභාවිකය. එහිදී තම අරමුණු මුදුන්පත් කර ගැනීමේදී නීතිය සදාචාරාත්මක බව ඔවුන්ට ගැටලුවක් නොවේ. නමුත් කලක් යාමේදී පාලිත ජන කණ්ඩායම විසින් මේ ක්‍රියාකාරකම් වලට එරෙහිව සංවිධානය වී හඬ නැගීම සිදු කරනු ලබයි. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේදී ලංකාවේද සිදු වූයේ මෙම තත්ත්වයමය. එනම් අධිරාජ්‍යවාදීන් විසින් තම ලාභ ලැබීමේ අපේක්ෂාවෙන් මෙරට තුළ ක්‍රියාත්මක කළ සුරාව, මධ්‍යසාර ප්‍රචලිත කිරීමේ ප්‍රතිපත්තිය හැඳින්විය හැක. ලංකා සමාජයට සුරාපානය අලුත් දෙයක් නොවුනත් අධිරාජ්‍යවාදීන් විසින් උපක්‍රමශීලිව සමාජයට එක් කළ සුරාවට මුලදී සීමිත පිරිසක් පමණක් නැඹුරු වේ. අධිරාජ්‍යවාදීන් විසින්ම මේ ව්‍යාපාරය ප්‍රචලිත කිරීමට නෛතිකව ආධාර දීම නිසා එය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වුණි. බෞද්ධ දර්ශනය පදනම් කරගත් ශ්‍රී ලංකාව තුළ සුරාව සඳහා සදාචාරාත්මකව අවකාශ නොමැති සේම මේ සඳහා බෞද්ධ ජනයා මෙන්ම වෙනත් ආගමික දර්ශන තුළින්ද විරෝධතා එල්ල විය. මේ අයහපත් පාලන ප්‍රතිපත්ති නිසා ඇතිවන්නේ සදාචාර විරෝධී හා ලාංකීය සංස්කෘතිය උඩු යටිකුරු කිරීමට සමත් සිදුවීම්ය. මත්පැන් අලෙවිය හා සමාජ දුරාචාරය සීඝ්‍ර වෙත්ම මේ සඳහා නැගුන විරෝධතාව සමාජ ව්‍යාපාරයක් දක්වා විකාශනය විය. පසු කල් වෙත්ම බොහෝ දෙනා පෙළ ගැසෙන්නේ මෙතුළින් සිදුවන සමාජ ආර්ථික හා ආගමික පරිහාණිය වැළැක්වීම අරමුණු කරගෙනය. එහි උච්චතම අවස්ථාවන් විසිවන සියවසේ මුල් දශකයේදී පමණ දැකගත හැකි වේ. විරෝධතාකරුවන් අතුරින් අනුරාධපුර, හලාවත වැනි ප්‍රාදේශිය සංවිධාන බිහිවීම, අනගාරික ධර්මපාලතුමා වැනි ජාතික නායකයින් මේ ව්‍යාපාරයට සම්බන්ධ වීම හා පුවත්පත් සඟරා වලින් ප්‍රචාරය ලැබීමත් නිසා ව්‍යාපාරයේ පැතිරීම ප්‍රබල විය. නායකයින්ගේ පමණක් නොව බහුජනයාගේද ව්‍යාපාරයක් වන මෙය පසු කල් වෙත්ම ජාතික ව්‍යාපාරයක මුහුණුවර ගැනීමට සමත් වෙයි.

ප්‍රමුඛ පද ඃ බ්‍රිතාන්‍ය යටත් විජිතය, මධ්‍යසාර, ප්‍රතිවිරෝධය,

---

[1] පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය.සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය hiran6361@gmail.com